# ඉතිං මට සමාවෙන්න

# ඉතිං මට සමාවෙන්න

(Poetry Collection of Apologization )

අබ්දුල් උමර් සහන් නෙත්මිණ

කර්තෘගේ වෙනත් කෘති

- තටු සිඳුණු කුරුල්ලා ( *කාව්‍ය-2019* )
- ඒ තමයි ජීවිතේ කලින් මට නොපෙණුන ( *කාව්‍ය-2022* )
- පිළුණු වී ඇති මාවතේ සොයනවද නුඹ ජීවිතේ (*අධ්‍යාපන අමාත්‍යංශය විසින් සංවිධානය කරන ලද රටක් වටින පොතක් තරගයේ ජයග්‍රාහී කෘතියකි* )
- බයෝ කරපු ඒලෙවල් ( *බයෝ කාරයන්ගේ කවි පොත* )
- බයෝ කරපු ඒලෙවල් 02 ( *බයෝ කාරයන්ගේ කවි පොත* )
- බයෝ කරපු ඒලෙවල් 03 ( *බයෝ කාරයන්ගේ කවි පොත* )
- ඒත් මං ආදරෙයි ( *ආදරයේ කාව්‍ය සංග්‍රහය* )

- Abdul Umar Sahan යූටියුබ් අවකාශය

ඉතිං මට සමාවෙන්න

© අබ්දුල් උමර් සහන් නෙත්මිණ

ISBN 978-624-95698-6-7

පළමු මුද්‍රණය - 2024 ඔක්තෝබර්

පිටකවරය
අබ්දුල් උමර් සහන් නෙත්මිණ

පරිගණක අක්ෂර සංයෝජනය
අබ්දුල් උමර් සහන් නෙත්මිණ

පරිගණක පිටු සැකසුම
අබ්දුල් උමර් සහන් නෙත්මිණ

ප්‍රකාශනය
අබ්දුල් උමර් සහන් නෙත්මිණ

මුද්‍රණය

නියෝ ග්‍රැෆික්ස් (පුද්ගලික) සමාගම
44, උඩහමුල්ල දුම්රියපළ පාර,
ගංගොඩවිල, නුගේගොඩ.
දුරකතන: 0112 820 220



හිතන්න
-මොනවද

ගොඩක් දේවල්
-ගොඩක් දේවල් හිතනවා

ඕනෙම දේවල් අතෑරලා



මම කොච්චර ආදරෙයි කිව්වත්
ඔබට දැන් එය නොදැණුනොත්
මට කිසිඳු පුදුමයක් නොවුණි

ඔබ එදා ආදරෙයි කියද්දී
මට වුණත් පෙරළාම
ආදරෙයි කියන්නට තිබුණි

දුක්වෙලත් වැඩක් නෑ
ඇත්තටම බැලුවොතින්
ඒ ඉතිං අතීතය පමණි

මේක ඔබ ගැන පොතක්
ඒත් ඔබ වෙනුවෙන්ම
ඔබේ නම ලෝකයෙන් වසමි

මගෙ ඇනබේත්ට...!

## මේක කොයි තරම් වැදගත්ද කියලා ඔයාට තේරෙද්දි, ඔයා ගොඩාක් පරක්කු වෙලා තියෙන්න පුළුවන් !

" ඔයා හරි ආදරණීය මනුස්සයෙක් ! "

කවුරුහරි මට එහෙම කියන වතාවක් වතාවක් ගානෙ මට ඕනෙ වුණේ " ඔයා එයා ගැන දැනගෙන හිටිය නං ! " කියලා කියන්නයි. ඒත් එහෙම කියන්න තරං මට හයියක් තිබ්බෙ නෑ. ඉතිං මගෙ ඇතුළතින් යමක් පිච්චිලා යනව වගේ දැනෙද්දි මම කරපු එකම දේ ටිකක් හිනාවෙලා, " ඔයා මං ගැන හරියට දන්නෙ නෑ ! " කියලා කියපු එක විතරයි.

එයා ගැන මම හරියටම කාත් එක්ක හරි කතා කරා නං මට මතක හැටියට ඒ මගෙ හොඳම යාලුවා එක්ක විතරයි. ඒලෙවල් කාලෙ අන්තිම හරියෙ පන්ති ඇරිලා ගෙදර යනකොට, එහෙමත් දවසක ගෙදෙට්ටත් නොකියා හොස්ටල් එකෙනුත් පැනලා හරින්ලෑ ගෙදර යන්න ට්‍රේන් එකේ ෆුට් බෝඩ් එකේ ඉඳගෙන ඉන්නකොට, ඕනෙම විකාරයක් ගැන පටං ගන්න කතාවක අන්තිම හරිය

වෙනකොට... අපි අනිවාර්යයෙන්ම එයා ගැන කතා කළා.

අපි දෙන්න අතර ඇතිවෙච්ච හැම කතාබහකදිම වගේ, අපි මුණගැහුණු හැම දවසකම වගේ එකම එක වචනයක් හරි අපි එයා ගැන කතා කරලා තිබුණා. මම ඇනබෙත් කියන්නෙ කොයි තරම් ලස්සන, කොයි තරම් ආදරණීය කෙනෙක්ද කියලා කියද්දි හරීන් මාරියා කියන්නෙ කොයි තරම් ලස්සන, කොයි තරම් ආදරණීය කෙනෙක්ද කියලා කිව්වා.

එයාලා දෙන්නම කොයි තරම් ලස්සන කොයි තරම් ආදරණීය අයද කියලා අපි ඒ වෙනකොටත් දැනගෙන හිටියා වුණත් අපිට ඒ කතාබහ කවදාවත්ම එපා වෙලා තිබුණෙ නෑ. අන්තිමටම හැමදාමත් වගේ අපි කොයි තරම් ජරා මිනිස්සුද කියලා අපි අපිටම බැනගත්තා. " **අපිට මෙහෙම වෙලා මදි !** " ඒ කතාබහ කෙළවර අපි හැමදාම කිව්වා.

" **මට අනුව නං මේ ලෝකෙ ඉන්න ජරාම මනුස්සයා මම !** "

හරීන්ලෑ ගෙදර යන්න කෝච්චියට නැගලා ෆුට් බෝඩ් එකේ ඉඳගෙන ඉන්න දවසක හරීන් එහෙම කිව්වා. ඒ වෙද්දි කලුවර වැටිලා තිබුණ නිසා වටපිටාව පැහැදිලිව පෙණුනෙ නැතත් ඈත මුහුදෙ ඉදං රැල්ල පෙරළිලා එන විදිහ කෝච්චියේ ඉඳගෙන ඉද්දි වුණත් සුදුම සුදු පාටට පෙණුනා.

මුහුදු සුවඳත් එක්ක ලුණු රහකුත් අරගෙන ආව හුළඟ මම පුළුවන් තරං තදට පෙනහලු තුළට ඇදගත්තා. මුහුදු හුළඟ කවදත් මට අරගෙන ආවෙ සැහෙන්න හොඳ හැඟීමක්.

ඒක දැණුනෙ නිකං හරියටම මම මාව අයිති නියමම තැනට ඇවිත් වගේ. මම මාලුවෙක් වුණා නං එහෙම කියන එක ගැන කවුරුවත්ම විරුද්ධ වෙන්නෙ නැති වෙන්න ඉඩ තිබුණා. ඒත්

මනුස්සයෙක්ව කොහොමද දෙයියනේ මුහුදට අයිති වෙන්නෙ ?

" උඹ දන්නවද මම පොසයිඩන්ගෙ පුතා කියලා ? "

කිසිම ගැලපීමක් නැතුව මම හරීන්ගෙන් ඇහුවා.

මීට අවුරුදු හතරකට කලින් මම පළවෙනිම වතාවට පොසයිඩන්ගෙ පුතා වෙච්ච වෙලාවෙ කිසිම විරුද්ධත්වයක් නැතුව එයා ඒක පිළිඅරගෙන තිබුණා. අවුරුදු 16 ඉඳං අවුරුදු 20 වෙනකං ජීවිතේ ගෙවීගෙන යද්දි සමහරක් කාලවල පොසයිඩන්ගෙ පුතා මම කියන එක මටත් අමතකවෙලා ගිහිනුයි තිබුණෙ. ඒත් අවුරුදු ගාණක් තිස්සෙ මං ගැන කිසිම ආරංචියක් නැතුව තියෙද්දිත් එයාට පොසයිඩන්ගෙ පුතා ගැන මතක තිබිලා තිබුණා.

" මම දන්නවා එයා ඇතීනගෙ දුව කියලත් ! "

රේල් පීලි උඩ කෝච්චිය යද්දි එන " ඩොක.. ඩොක " සද්දෙයි මුහුදෙ රැළි බිඳෙන සද්දෙයි මැද වුණත් මට හරීන්ව පැහැදිලිව ඇහුණා.

" උඹ දන්නවද එයා ගොඩාක් හොඳ, ගොඩාක් බුද්ධිමත්, ගොඩාක් ආදරණීය කෙනෙක් ! "

මම මුහුද දිහා බලාගෙනම කිව්වා.

" ඔව් මං දන්නවා ! "

" ඇයි බං මං එයාට එහෙම කරේ ? "

ඒ ප්‍රශ්නෙ මම ඇහුවෙ උගෙන් නෙමෙයි මගෙංමෙයි කියල හරීන්

වෙනවා දකින්න මම කොහොමටවත්ම කැමති නෑ. ඒකෙං ඔයාට සදාකාලික පසුතැවිල්ලක් ඉතුරු වෙන්නත් පුළුවන්.

ඒත් මම මේ ගැන මෙච්චර කියන්නෙ ඔයා ගැන හිතලා නෙමෙයි. ඔයා අතින් තැලිලා, පොඩිවෙලා, බිඳිලා, සදාකාලිකව දුක් විදින්න ඉඩ තියෙන එයාගෙ වගේ රත්තරං හදවත් තියෙන අය ගැන හිතලා.

ඒ මිනිස්සුන්ට එහෙම කරන්න එපා.

සරලවම කියනවා නං මං වගේ කෙනෙක් වෙන්න එපා !!!

අබ්දුල් උමර් සහන් නෙත්මිණ
67/35, කිත්තම්පහුව පාර, වැල්ලම්පිටිය
abdulumarsahan006@gmail.com
076 285 6068 /071 864 3738

" මං ගොඩක් වටින කෙනෙක්. මාව පරිස්සං කරගන්න ! "

" ඇත්තට.. ඔයා කොයි විදිහටද වටින්නෙ? "

" ඔයාට දවසක තේරෙයි "






# මේ රැය හරිම අඳුරුයි

මෙ රැය හරිම අඳුරුයි
ඉවසන්න බැරිම තැනකදි
තරුවක් වුණත් පුපුරයි
ඒත් ඔබ හරිම නිහඬයි

ඔබ හොඳින් නොවන බව වැටහෙයි
හොඳින් නොවන බව වැටහෙනාමුත්
ඒ ඇයිදැයි නොවැටහෙයි
"ප්‍රශ්නයක් දැ?"යි විමසුවත්
ඔබ දිගින් දිගටම නිහඬයි
ඔබට වැරැද්දක් කියන්නත් බෑ
ඔබෙ විශ්වාසය බින්දෙ මම ම යි

මෙ රැය හරිම අඳුරුයි
ඉවසන්න බැරිම තැනකදි



තරුවක් වුණත් පුපුරයි
ඒත් ඔබ හරිම නිහඬයි

දරාගත නොහැකි තනිකමක් තුළ
ඔබ දිගින් දිගටම ගුලිවෙයි
ලෝකෙන්ම හැංගෙන්න ඕනෙ බව
ඇතැම් විටකදි පවසයි
කොයිතරම් එපා කියලා කිව්වත්
ඔබව නවත්තන්න මට නොහැකියි
ඔබේ ජීවිතේ ඇතුළෙ
දැං මගෙ බලය බෝ දුබලයි
ඔබට වැරැද්දක් කියන්නත් බෑ
ඔබේ විශ්වාසය බින්දෙ මම ම යි

මේ රැය හරිම අඳුරැයි
ඉවසන්න බැරිම තැනකදි
තරුවක් වුණත් පුපුරයි
ඒත් ඔබ හරිම නිහඬයි

ඔබ දුකින් බව මට වැටහෙයි
ඔබ වෙනුවෙන් යමක් කළ යුතුව ඇතත්
කළ යුතු යමක් නොවැටහෙයි
තැග්ගක්වත් එවන්න බැරි වෙන්න
ඔබ මට වාරණ දමා ඉවරයි
ඔබට වැරැද්දක් කියන්නත් බෑ
ඔබේ විශ්වාසය බින්දෙ මම ම යි

මේ රැය හරිම අඳුරැයි
ඉවසන්න බැරිම තැනකදි
තරුවක් වුණත් පුපුරයි
ඒත් ඔබ හරිම නිහඬයි





ඔබ තනියෙන්ම දරාගත යුතු නැති බව
ඔබට තවමත් බෙදාගත නැති බව
පවසන්න මගේ ගීත දඟලයි
ඒත් මිනිස්සු ඔබව බිඳ දමා ඉවරයි

ඔබට හම්බුණ ගොඩක් අය
මට හිතෙන්නෙ මං වගෙම වෙලලුයි


හැමදේකටමත් පස්සෙ
ඇත්තටම මට කියන්න ඕනෙ
ඔබ තනිවෙලා නැති බව විතරයි
ඔබට ඕනෑම මොහොතක
ඕනෑම දෙයකට අමතන්න
මම තාමත් ඉන්නෙ මෙතනයි

ඒත් ප්‍රශ්නෙකට තියෙන්නෙ
ඔබ අමතන්නෙ නැති එක විතරයි
ඔබට වැරැද්දක් කියන්නත් බෑ
ඔබ අච්චරක් කතා කරද්දි
ඇහුන්නෑ වගේ හිටියෙ මම ම යි

මේ රැය හරිම අඳුරුයි
ඉවසන්න බැරිම තැනකදි
තරුවක් වුණත් පුපුරයි
ඒත් ඔබ හරිම නිහඬයි

මට ඔයාට කියන්න ඕනෙ වුණේ
ඔයා තනිවෙලා නෑ කියලා විතරයි
ඔයාට ඕනෙ ඕනෙම වෙලාවක
ඕනෙම දේකට
මම තාම මෙතනයි







# 2

# මට වඩා හොඳ කෙනෙක්

කොටුවක් පයින්න ඔන්න මෙන්න මොහොතක
මම ඉඳගෙන හිටියෙ මුහුදු වෙරළක
ඇය වුණත් අතැඟිලිවලින් මිරිකද්දි මගෙ අත
වෙනදටත් වැඩිය හයියෙන්
ගැහෙන්න අරගත්තා හදවත

අන්න එතකොටයි මම දැක්කෙ ඔබෙ මුහුණ
වෙරළට කඩාගෙන වැදුණු රළ මත
මා සමග තරහවක් නැති බව
ඔබ එදා කිව් විදිහටම
කොහේදෝ යන සුළං රැල්ලක්
තෙපලුවා මා සවණත
ඔබේ කටහඬත් අරගෙන



කොටු පනින එක කෙසේ වෙතත්
ඔබේ කටහඬ අභිමුව
කඩාගෙන වැටී සමතලා විය
මගේ ගාලුකොටු හදවත

ජීවිතේ එක්තරා කාලයක් විය
මට ඔබව අමතකව ගිය
ඔබ ඔබේ ජීවිතේ අමාරුම මං දිගේ
තනියෙන්ම ඇවිදගෙන ගිය

අමාරුම මාවතක තනියෙන්ම ඇවිදිද්දි වුව
නියඟයක් ආ වෙලේ ඔබම අරගෙන ආවා දිය !
දරන්නට බැරිම වී උණුසුම
වෙලාවක මම මැරෙන්නට ගිය

ඉතිං මගෙ පණ බේරුවේ ඔබ !

ඔබට ඕනෙම තැන්වලදී
යළි යළිත් ඔබව අතැරපු මම
මම වැටෙන හැම විටම
ආයෙමත් අත දීපු ඔබ

ඔයා කවදාවත් දැනගන්න එකක් නෑ
කොයි තරම් නං අප්පිරියයිද මට මම
අන්න ඒ නිසාමයි මම හිතුවෙ
මට වඩා හොඳ කෙනෙක් ලබන්නම ඕනෙ ඔබ








# බොහෝ කල් ගතවෙලා තිබුණා

පාරක් පාරක් ගානෙ
ඉබාගාතෙ ඇවිදින පිස්සුවක්
ඉස්සර ඉඳං මට තිබුණා
බොරු කියන්න ඕනෙ නෑ
ඇවිදිල්ල වැඩි නිසා විඳවිල්ල වුණත්
අඩු නැතුව හැම තැනම තිබුණා
සමහරක් තැන්වලදී මට ඇඬුණා !

ඇවිදින්න පටං ගත් පාරවල්
අතරමග නොහැරෙන්න නීතියක්
කවුරුහරි මට දාලා තිබුණා
ඒ නිසා රිදෙද්දිත්
යටි පතුල් කැපෙද්දිත්
බොහෝ දුර මම ගිහින් තිබුණා



පාරවල් බොහොමයක් කෙළවර
ගව් ගනං දුර ගෙවා අගවර
මුතුන් නැතුවම ආව පාරෙම
ආශය එන්නත් සිද්ධවුණ තැන්
අඩු නැතුව බෝ තිබුණා

සමහරක් පාරවල් කෙළවර
කවමදාවත් නොගිතූ විදිහට
අපායත් මුණ ගැහුණා
ඉතිං මට ගොඩක් රිදුණා

පාරක් පාරක් ගානෙ
ඉබාගාතෙ ඇවිදින පිස්සුවක්
ඉස්සර ඉඳං මට තිබුණා
බොරු කියන්න ඕනෙ නෑ
ඇවිදිල්ල වැඩි නිසා විඳවිල්ල වුණත්
අඩු නැතුව හැම තැනම තිබුණා
සමහරක් තැන්වලදි මට ඇඬුණා

මටත් පුදුමයි හැබැයි
කොයි තරම් ඇවිද්දත්
එකම එක පාරකදි
හදිසියෙම මම මගින් හැරුණා
සුසිනිඳුම මුහුදු වැලි
ඒ පාර මග දිගට
සනීපෙට මට දැණුනා
ඒ වුණත් මගදි මම හැරුණා

ගල් බොරලු මාවත් දිග
වංකගිරිවුව පසුකර





ආයෙ ආයෙම අපායට යන
පාරවල් මට ලැබුණා


කොයි තරම් වේදනා දැණුනත්
කටු අකුල් යටි පතුලෙ ඇණුනත්
මගදී නොහැරෙන්න හිතකුත්
මට ඇවිල්ලා තිබුණා
ඉතිං ඒ පාරවල් කෙළවර
ආයෙ ආයෙම යළි අපායක
මාව නොමැරී මැරුණා

කොයිතරම් ඇවිද්දත්
ඒකාලෙ ඉන්දැද්දී
මට නොතේරුණ දෙයක් තිබුණා
මගින් හැරී මාවතේ
කෙළවරට ගියා නං
මට ස්වර්ගයක් ලැබෙන්නත් තිබුණා

ඒ වුණත් ජීවිතේ
හැමදාම වගෙ එදත්
හොඳම දේ මග ඇරී තිබුණා
ස්වර්ගයක් පෙනි පෙනී
අපරාදෙ අපායක
නිකරුණේ මම මැරිලා තිබුණා

ආයෙමත් ඒ පාර
කොහොමහරි හොයාගෙන
මේ දැනුත් මට යන්න හිතුණා
ඒ වුණත් සිතියමෙන්
පාරවල් මැකී ගොස්
බොහෝ කල් ගතවෙලා තිබුණා








# ඔබ වගේමයි ඇය !

සතර මහ පෙරනිමිති දැක
සසර මග එපා වූ තැන
සිද්ධාර්ථත් ගිහින් තිබුණා
ගිහි ගෙදර අතහැර


වෙස්සන්තරව සිටි කල
ළය පැලෙන්නම දුක
දුන්න එක ගැන තරහවක් නැති
යශෝදරාමය හිත

රිදෙන බව දැන දැනම හොඳටම
ආයෙ පාරක් ඔහු වෙනුවෙන්ම
ඔන්න ඉපදී ඇත
ඔබ වගේමයි ඇය !



අත් හැරීමක අපහසුව ගැන
ඇසෙයි මට නෙක වර
නොයෙක් තැන එක එකා තෙපලයි
අත් හැරීමක ගුණ
හිතන් යනවා මට !

අත අරිනවට වඩා
කොයි තරම් නම් අමාරුද
අත්නැර ඉන්න එක
අත ඇරපු තැන්වල පවා
අල්ලගෙන ඉන්න එක
ඒක මට ඉගැන්නුවෙ ඔබ !





# "ඔයාල ඈත් වුණේ ඇයි?"

( "ඔයාල ඈත් වුණේ ඇයි?"

"මම එයාව මගාරින්න පටං ගත්ත නිසා"

"ඇයි එයා ඔයාට වදයක් වුණාද?" )

අහසක තරං බර
උරහිස උඩට කඩාගෙන වැටෙද්දී වුව
" මටත් පැත්තක් දෙන්න ! "
හිනැහෙමින් කිව්වෙ මට ඇය

ලෝකෙන්ම තනිවෙලා
මුල්ලකට ගුලිවෙලා
කඳුලු කැට වැටෙද්දී වුව
මාත් එක්කම ඇඬුවා ඇය !





ඔබ හිනන හැටි වැරදියි
හද ඉල්ලලා අඩන කෙල්ලෙක් නෙමෙයි ඇය
ඔබ තරුවක් දුන්නොතින් ඇයට
ඇය ගොඩක් විට කියාවි
කනාමැදිරි එළියක් වුණත්
හොඳටෝම ඇති වග

කොයිතරම රිදෙද්දිත්
නොරිදුණා වාගේ
හැමවිටම ළඟ රැඳුණු ඇය
" පරිස්සං කරගන්න මාව ! " කිව්වේ
හොඳටෝම රිදුණු පසු විය හැක

ඇවිලෙද්දි ගිනිගොඩක් පපුව මැද
දිය බිඳක් වුණේ ඇය
පුදුමයක් නොතේරුණ විදිහ මට
ඇය තනිව දරාගත් බර

ඉතිං ඔබ ඔය අහන විදිහට
" ඇය වදයක් වෙන්න පුළුවන් ද මට? "
ඉරි තැලී කරවෙච්ච පොළොවකට
පැන් පොදක් වුවාම මිස

ඒත් ප්‍රශ්නෙකට තියෙන්නෙ
ග්‍රීස්මෙට හුරුවෙච්ච පොළොවක
කැකෑරෙන නියංසායම මිස
දිය පොදක් නොරඳනා එක !




" මාව විශ්වාස කරන්න ! "

" ඔයා මාත් එක්ක හිටපු නැති කාලෙත් මම ඒක තමයි කරේ. "

" මොකක්ද ? "

" ඔයාව විශ්වාස කරපු එක ! "







# ගිනි තියාගෙන මැරෙනවා !

පොළොව හා ආදරෙං බැඳුනම
සමහරක් තරු අහස අතහැර
හිතුමනාපෙට හිතෙන විදිහට
කඩාගෙන බිම වැටෙනවා

මගක් දුර ආවටත් පස්සේ
අහස දුන් ඒ අමිල සෙනෙහස
ආයෙම උන්ට දැනෙනවා
ඉතිං දැං උං අඬනවා

ඒ හින්දමද කොහෙද මන්දා
කඩාගෙන වැටුණ බොහොමයක් තරු
පොළොව හමු වෙන්නටත් මත්තෙන්
ගිනි තියාගෙන මැරෙනවා !








# ඔයාට මතකයිද ඒ යුද්ධය

( එක්කො ඔයා පර්සි ජැක්සන් කියලා හිතාගෙන කියවන්න. එහෙම නැත්තං ඔයා ඇනබෙත් චේස් කියලා හිතාගෙන කියවන්න. )

ඔයාට මතකයිද ඒ යුද්ධය
ඔත්‍රිස් කන්ද මුදුනේදි ඇතිවුණ
දඩයක්කාරියන්ගෙ දෙවඟන වෙලත්
ආටෙමිස්ටත් වැඩේ වැරදුණ

ඇට්ලස් වුණත් අහස අතැරපු හවසක
අපේ ජීවිත වුණත් පුවර් නැති දවසක
උපදෙව්වරු වෙලත්
අහසට කරගැහුවා
මාරුවෙන් මාරුවට ඔබ මම



නාමත් තියෙද ඒ සුදුපාට පැල්ලම
අවුරුදු දාසයේදීම
කොණ්ඩෙ පැත්තක් සුදු වුණ
"නාකියයි... නාකිච්චියි" කියලා
සරදම්වලට මැදිවෙන්න සිදුවුණ

ආදරේ කරන අය නැතිවුණ
ඇස් ඉස්සරහ පෙනි පෙනී මියැදුණ
ඔයාට මතකයිද ඒ යුද්ධය
ඔත්‍රිස් කන්ද මුදුනේදි ඇතිවුණ

ඉතිහාසයේ හැම තැනකම
ආයෙ ආයෙත් කියවුණ
ඒ වීරයා හර්කියුලිස්
මගදී අතහැර නික්මුණ
සෝයි නවෂේඩ යන්න ගිය හැටි
කොහොම අමතක වෙන්න ද?

මම හර්කියුලිස් වගේ නෙමෙයි කියලා
අන්තිමට ඇයත් පිළිගන්නට
දැං මම ආයෙ ඔබෙන් ඇහුවොත්
ඔබට කියන්න තියෙන්නෙ මොනවද?

අහසෙ බර නිසා ඇතිවුණ
කොණ්ඩෙ සුදුවුණ පැල්ලම
ඇත්තටම ඒකත් පැල්ලමක්ද
මම ඇති කරපු පැල්ලම් දැක්කම



අහසෙ බර නං මොනවද
මම දුන්න බර එහෙමද
ඇත්තටම අපි හැරිලා බැලුවොත්
සෝයි කිව්ව දේ වැරදිද
කෙලවරක ඉඳං බලං යනකොට
මමත් හර්කියුලිස් වගේම නෙමෙයි ද?

ඔයාට මතකයිද ඒ යුද්ධය
ඔත්‍රිස් කන්ද මුදුනේදී ඇතිවුණ
දඩයක්කාරියන්ගෙ දෙවඟන වෙලත්
ආටෙමිස්ටත් වැඩේ වැරදුණ





# 8

## මගෙ නෙස්කැෆේ දෙක ඉවරයි !

බීර වීදුරු පිරවෙයි
සිගැරට්ටුවක් දැල්වෙයි
අකීකරු වූ නිකොටීන් දුම
පංකාව යට කැරකෙයි
මගෙ නෙස්කැෆේ දෙක ඉවරයි !

එකම මේසෙක වාඩි වී අප
සංවාදවල පැටලෙයි
එකම මේසෙක වුණත් තැන තැන
එක එක කතා මතුවෙයි
නිවි නිවී යළි දැල්වෙයි
එකපාර එන මහ සිනා රළ
මුලු මේසයම වටලයි
මගෙ නෙස්කැෆේ දෙක ඉවරයි !





මේසයේ එක් පසක් තනිකර
ක්‍රිකට්වලිංම ඇවිලෙයි
ඇවිලී ඇවිලී නිවී යනකොට
බිත්තියක ඇති විසල් තිරයක්
නිවෙන ගින්නට පිදුරු දම දම
හිටු කියා යළි අවුලයි

මේසයේ එක්තරා කොටසක
හුදෙකලා වූ වෙනම අන්තෙක
නෝනලාගේ කතා බහකුත්
හෙමි හෙමින් හිස ඔසවයි
මට හිතෙන්නේ ඒ කතා බහ
කොහොමත් ක්‍රිකට් පරදයි
මිනිත්තුවකට දහය ගානේ
අලුතින් ටොපික් මතුවෙයි

බීර වීදුරු පිරවෙයි
සිගැරැට්ටුවක් දැල්වෙයි
අකීකරු වූ නිකොටීන් දුම
පංකාව යට කැරකෙයි
මගෙ නෙස්කැෆේ දෙක ඉවරයි !

එක පාර එන මහ සිනා රැළි
මුලු මේසයම වටලයි
ඇතැම් විටකදි මේසෙ පරයා
මුලු තැබෑරුම වටලයි
එහෙම විටකදි වේටර් ඇවිත්
සද්දෙ වැඩි බව පවසයි
කොහොම කිව්වත් රැල්ල එන එක
වෙරළකට බෝ සුලබයි





බීර විදුරු පිරවෙයි
සිගැරැට්ටුවක් දැල්වෙයි
අතීකරු වූ නිකොටින් දුම
පංකාව යට කැරකෙයි
මගෙ නෙස්කැෆේ දෙක ඉවරයි !








# මගහැරි සයුරක දැක්ම

අනහැර දමා දිය පිරි සයුරක් නික්ම
මිරිඟුව පස්සෙ ලුහු බැඳ කාලය ඉක්ම
කතරක ඇද වැටී පණ ගැහෙනා තෙක්ම
මම නොදුටුවෙමි මගහැරී සයුරක දැක්ම

නික්ම ගියත් ඔහු ආපසු එන දවස
සන්සිඳුවමි කියා ඔහුගේ දිය පවස
සයුරක් බලා සිටියලු දවසින් දවස
ඉඩෝරයට බිලිවෙන්නට පෙර හවස





දෙවසරකුත් ගෙවිලා කාලය ඉක්ම
නැතිවුණ තැනදි පෙර මග සලකුණු දැක්ම
නියඟය වුණත් සැඩ විය ඇවිලෙන තෙක්ම
සයුරක් හිඳුණි නැතිවම කාගෙත් රැක්ම



# 10

# මලක් මට මගහැරුණි ඉස්සර

අතීතයෙ එක්තරා තැනකදි
මලක් මට මගහැරුණි ඉස්සර

මතක උහුලන් හිනාවෙන එක
එය තමයි ඇත්තටම දුෂ්කර

මගහැරුණු තැන් අත් හැරුණු තැන්
ආයෙමත් මුණ ගැහෙන තැංවල

" හිනා වෙන්නද ? අඩන්නද දැං ? "
හිනාගනු බැරි එකයි ලස්සන





" එයාලා කොයිතරං කිව්වත් ඔයා ආයෙ එන එකක් නෑ කියලා, ඇත්ත තේරුං ගත්ත දවසක ඔයා ආයෙ එනවමයි කියන විශ්වාසෙන් මං බලාගෙන හිටියා. "





11

# ඇගේ ඒ රත්තරන් හදවත


" ඔයා හරිම ආදරණීයයි ! "
කවියක පදයක් දෙකක් කියවා
ඔබ මට කළබලෙන් කියයි

" ඉවසන්න මා හිතවත ! "

ඔබ තවම දන්නෙ නෑ
කන්දක් තරං උහුලා
කෙන්දකුත් නැතුව හැංගුණ
ඇගේ ඒ රත්තරන් හදවත








# බලාගෙන සිටි අහසකි

කවුරු කවදා කොහොම කිව්වත් ජීවිතේ නම් රහසකි
නිවන් දැක දැක අපායට ගිය අවස්ථා සිය දහසකි
මංමුලාවී වී ඔහේ ඇවිදපු මතක පිහිතුඩු පහසකි
නැගෙන තුරු හිරු දැවුරුද්දක් බලාගෙන සිටි අහසකි









# ආයෙ ඔබ වෙත හැරෙන්න

බැරිම හින්දා කවමදාවත් ආයෙ ඔබ වෙත හැරෙන්න
කිසිත් කියන්න බැ ඉතිං මට, " සමා වෙනු මැන! " ඇරෙන්න
ජීවිතේ නව බොහෝ දුර ඇති අතරමග බැ මැරෙන්න
ඔබත් ඔහොමම මගදි හමුවන වංගුවක් ළඟ හැරෙන්න






# ඔයත් එක්කම ඇවිදගෙන එන්න

ඔයාට පුලුවන්ද මට
අතීතෙට යන්න වරයක් දෙන්න

අතර මග එහෙ මෙහෙ නොයා
ඔයත් එක්කම ඇවිදගෙන එන්න






# ඔයා එනවද නන්දා ?

කුංජු අමතකව ගිය නිසා
පෝ දැං නිකංම නිකං
බඩ බෝල පැන්ඩා

විල්ගැක්ස් එක්ක සටනට කලින්
රතු දැවැන්ත අඟා
ඔම්නිට්‍රික්ස් එකෙන් පැන්නා
ඉතිං විල්ගැක්ස් දින්නා

ආදරේටත් වඩා ගොඩාක්ම බලගතු
මොකක් හරි දෙයක් තිබුණා
ඉතිං ඔයා දන්නවද
හැරී එදා පැරදිලා
වෝල්ඩමෝට් දින්නා






ඇනබෙත්වත් වඩා
මගදි ආ රේවල්ව
පර්සිටත් ලොකුවෙලා තිබුණා
ඔයා දන්නෙ නැතුව ඇති
එදා ඒ යුද්දෙ මැද
ලූක් පර්සි ජැක්සන්ට කෙටුවා
ඇනබෙත් නැති නිසා පර්සි මැරුණා !

කොයිතරම් බෑ වගේ පෙණුනත්
මේ හැමදේම හරිගස්සන්න
පුළුවන් දෙන්නෙකුත් උන්නා
ඒ ඔයයි මමයි කියලා කිව්වොතින්
ඔයා විශ්වාස කරාවිද මන්දා

ඉතිං එහෙනං මම පියල් වුණෝතින්
ආයෙමත් මේ ගමන මුල ඉඳං යන්න
ඔයා එනවද නන්දා ?





ඇනබෙත්ටත් වඩා
මගදි ආ රේචල්ව
පර්සිටත් ලොකුවෙලා තිබුණා
ඔයා දන්නෙ නැතුව ඇති
එදා ඒ යුද්ධෙ මැද
ලූක් පර්සි ජැක්සන්ට කෙටුවා
ඇනබෙත් නැති නිසා පර්සි මැරුණා !







# බලාගෙන සිටි අහසකි

මම ආත්ම විශ්වාස කරන්නෙ නෑ තමයි
ඒත් බැරිවෙලාවත් තව ආත්මයක් තිබුණොතින්
අපිට පුළුවන් වෙයිද
ඒ ආත්මෙදිත් හම්බෙන්න

මම පොරොන්දු වෙනවා
ඒ ආත්මෙදි නං
මේ ආත්මෙදි වගේ නොවී ඉන්න

ඔයාට ඕනෙම තැංවෙලදී
ඔයාගෙ අත මගදි අත් නොහරින්න
පපුව හිල්වෙන වචන
නොහිතාම වීසි නොකරන්න
මගෙ පණ්ඩිතකම් පැත්තකින් තියලා





ඔයා කියන දෙයක් අහන්න
ආ නව දෙයක්...

ඔයා කියනකං ඉන්නෙ නැතුවම
ඔයාව පරිස්සං කරගන්න


හැබැයි...
ඉඩක් නැත්තෙමත් නෑ නේද
මම ඔයාව ඒ ආත්මෙදිත් රිද්දන්න

එක්කො අපි ආයෙ මුණගැහෙන්න ඕනෙ නෑ
මේ යන විදියටම යන්න ඉඩ දෙන්න

හැබැයි එක දෙයක් !
කොහෙ කොතන හිටියත් කමන්නෑ
ඔයා සතුටින් ඉන්න...

මට මගෑරුණු නව දෙයක් තියෙනවා...
" ඉතින් මට සමාවෙන්න ! "








# ලුහුබැඳ ගියපු තරු


නිවා හදක්
මුලු අහසම එලිය කෙරූ
කොහෙද කියාපන්
ලුහුබැද ගියපු තරු






# දැනෙනවා ළඟ වගෙ ඔයා

වේදනා දෙන රිදුම් සගවා
හදවතේ හිර කර තියා
රිදෙන බව දැන දැනම රිදි රිදි
ඒ වුණත් ඈතක නොයා
පාව යන කවි දහක් මැද්දේ
රැදෙන එක කවියක් ලියා
තාම තනිවෙන ගොඩක් තැංවල
දැනෙනවා ළඟ වගෙ ඔයා





# 19

# අපිට අපි හමුවිය හැකියි

අකමැතිම නං ඉතිං කමනෑ
මට නෑවිදින් ඉඳ හැකියි
ඒත් දවසක මග තොටක හරි
අපිට අපි හමුවිය හැකියි






# උතුම් දේකුයි ඇලීම

ළඟට නෑවිත් දුරක ඉඳගෙන
ඒද යැයි මග බැලීම
නේන බව කොයි කවුරු කීවත්
කොහොමවත් නොම සැලීම
දරාගන්නම බැරිම තැංවල
තනිව කඳුලැල් සැලීම
අත් හැරීමට වඩා දහසක්
උතුම් දේකුයි ඇලීම







" මම ඒ වගේ විශ්වාසයක් මගෙ ජීවිතේටම
දැකලා නෑ. දැං හිත හදාගත්ත තං හරි
කියලා මම වුනත් කියද්දි එයා උඹ
කවදහරි එනවමයි කියලා දිගින් දිගටම
බලාගෙන හිටියා ! "



21

# අල්ලගන්න බැරිවෙයිද අත් දෙක

("ඒත් මං ආදරෙයි" ආද්‍රයේ කාව්‍ය සංග්‍රහයේ එන "අතාරිමු අත් දෙක" කවියට ප්‍රතිකවියකි)

ආයෙ පාරක් අපිට
අල්ලගන්න බැරිවෙයිද අත් දෙක
කලු කුහරෙකට වැටුණයින් පස්සෙ
ආයෙ එන්නම බැයිද එලියට

හුළඟටත් කන් නොදී
මගෑරුන බිම්වල
ආයෙ අපි ඇවිද යමු
විශ්වයත් පසුකර

ඉතිං මම ආයෙමත් අහන්නෙ
අයෙ පාරක් අපිට
අල්ලගන්න බැරිවෙයිද අත් දෙක





ලස්සනම දේදුන්නකින්
යා කරමු හිත් දෙක

දැං මම දන්නවා
මේ ලෝකෙ ලස්සනම දේ
අත්නැර ඉන්න එක
අතැරපු තැන්වල පවා
අත්නැර ඉන්න එක

අන්තිමටමත් අහන්නෙ
ආයෙ පාරක් අපිට
අල්ලගන්න බැරිවෙයිද අත් දෙක





අපිව පිස්සුවෙන් වගේ මතක්
වෙන සමහරු ගැන අපිට
ගානක්වත් නෑ !




අබ්දුල් උමර් ශහන් නෙත්මිණා

සතර මහ පෙරනිමිති දැක
සසර මග එපා වූ තැන
සිද්ධාර්ථත් ගිහින් තිබුණා
ගිහි ගෙදර අතහැර

වෙස්සන්තරව සිටි කළ
ළය පැළෙන්නම දුක
දුන්න එක ගැන තරහවක් නැති
යශෝදරාමය හිත

රිදෙන බව දැන දැනම
හොඳටම
ආයෙ පාරක් ඔහු වෙනුවෙන්ම
ඔත්ත ඉපදී ඇත

ඔබ වගේමයි ඇය !



"බැරිම හිත්දා කවමදාවත්
ආයෙ ඔබ වෙත හැරෙන්න

කිසිත් කියන්න බෑ ඉතිං මට,
"සමා වෙනු මැන!" ඇරෙන්න

ජීවිතේ තව බොහෝ දුර ඇති
අතරමග බෑ මැරෙන්න

ඔබත් ඔහොමම මගදි හමුවන
වංගුවක් ළඟ හැරෙන්න"

LKR 1000

ISBN 978-624-95698-6

# ඉතිං මට සමාවෙන්න

Second half of the best selling poetry book "Eth Man Adarei"